# සාමාන්‍ය සමයේ දස අටවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ද්විතීය නීති සංග්‍රහයෙන් ගත් පාඨයෙකි.

**ද්විතීය නීති සංග්‍රහය 6: 4-13**

"දෙවි ස්වාමින් වහන්සේට නුඹේ මුළු හෘදයෙන් ප්‍රේම කළ යුතුය."

"ඉශ්රායෙල්වරුනි, සවන් දෙන්න. අපේ සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ අසහාය සමිඳාණන් වහන්සේ ය. දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද ඔබේ මුළු වීර්යයෙන් ද ප්‍රේම කළ යුතුය. අද දින මා ඔබට දෙන මේ අණ පණත් සිතේ ධාරණය කරගත යුතු ය. ඔබේ දරු දැරියන්ට ඒවා ඉගැන්විය යුතු ය. ඔබ ගෙදර සිටින විට ද, පාරේ යන එන විට ද, සැතපෙන විට ද, අවදි වන විට ද ඒවා ගැන ඔවුන්ට කතා කළ යුතුය. අතේ ලකුණක් වනු පිණිස, නළල මත ලලාට පටියක් වන පිණිස ද ඒවා බැඳ ගන්න. ගෙදර උළුවහු වල සහ දොරටුවේ ඒවා ලියා තබන්න."

"දෙවි සමිඳාණන් වහන්සේ ඔබේ පියවරුන් වූ ආබ්‍රහම් ට, ඊසාක්ට සහ ජාකොබ්ට දෙන්නට දිවුරා පොරොන්දු වූ දේශයට ඔබ ගෙනා පසු උන් වහන්සේ ඔබ ඉදි නොකළ විශාල දියුණු නගර ඔබට දානය කරන සේක. ඔබ නොපිරෙවූ, හොඳ හොඳ දේවලින් පිරුණු ගෙවල් ද ඔබ නොකැණූ ළිං ද, ඔබ නොවැවූ මිදි උයන් සහ ඔලිව ගස් ද එහි වනු ඇත. ඔබ ඒවා භුක්ති විඳ තෘප්තිමත් වූ පසු වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් ඔබ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ අමතක නොකරන්නට වග

බලා ගන්න. ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට පමණක් ගරු බිය පෑ යුතුය.

උන් වහන්සේට පමණක් වැඳුම් පිඳුම් කළ යුතුය. උන් වහන්සේගේ නාමයෙන් පමණක් දිවුරුම් දිය යුතුය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 18: 1-3, 46, 50

පිළිතුරු: මාගේ ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි.

ගීය:

මාගේ සව් ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි.
සමිඳාණෝ මාගේ පර්වතය ය. බලකොටුව ය. මිදුම්කාරයාණෝ ය.

ඔබ මා දෙවිඳාණෝ ය. පර්වත රජිඳාණෝ ය. මම ඔබ සරණ කොට ගතිමි. ඔබ මට පළිහ ය. ගැළවීමේ බලය ය. උස් කොටු පවුර ය. සියලු පැසසුම්වලට හිමිකම් ඇති සමිඳුනි, මම ඔබට අයැද සිටිමි.
මෙසේ මාගේ සතුරන්ගෙන් මම ගැළවෙන්නෙමි.

සමිඳාණෝ සැරදෙත්වා මාගේ ප්‍රාකාරය වන එතුමන්ට පැසසුම් වේවා
මාගේ විමුක්තිදායකයාණෝ අන් හැමටම පරමෝත්තම වන සේක.

එතුමාණෝ සිය රජුට ජය සිරි දෙන සේක. තමන් අතින් අබිසෙස් ලත් දාවිත් රජුට ද ඔහුගේ වංශයට ද සදහටම කරුණා කරන සේක.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණන්ගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක් ද කියා
අවබෝධ කර ගැනීමට
තේජසේ පියාණන් වූ අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ ප්‍රඥාව හා විදර්ශන ශක්තිය අපට දෙන සේක්වා!
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අපගේ මිදුම්කාරයාණන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ
මරණයේ බලය බිඳ දමා, ජීවනයත් අමරණීය භාවයත්
සුබ අස්න මගින් හෙළිකර වදාළ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 17: 14-20

"ශ්‍රද්ධාව ඔබට ඇත්නම් ඔබට නොකළ හැකි කිසිවක් නැත."

ජේසුස් වහන්සේ හා ශ්‍රාවකයෝ සමූහයා ළඟට ආ කල එක් මිනිසෙක් උන්වහන්සේ වෙත අවුත්, උන්වහන්සේ ඉදිරියෙහි දනින් වැටී, "ස්වාමිනී, මාගේ පුත්‍රයාට අනුකම්පා කළ මැනව. ඔහු මීමැස්මොර රෝගයෙන් මම ඔහු ඔබේ ශ්‍රාවකයන් වෙත ගෙනාවෙමි. එහෙත් ඔහු සුවපත් කිරීමට ඔවුන්ට නුපුළුවන් වී ය"යි කීය. ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "අහෝ! ශ්‍රද්ධා හීන හිතුවක්කාර පරම්පරාව, මා කොපමණ කල් ඔබ සමග සිටින්න ද කොපමණ කල් ඔබ ගැන ඉවසන්නද? ඔහු මා වෙත ගෙනෙන්නැ"යි වදාළ සේක. ජේසුස් වහන්සේ යක්ෂයාට තරවටු කළ සේක. එවිට යක්ෂයා ඔහුගෙන් දුරුව ගියේය. ඒ මොහොතේ පටන් ළමයා සුවපත් විය.

එවිට ශ්‍රාවකයෝ පෞද්ගලිකවම ජේසුස් වහන්සේ වෙත අවුත්, "ඒ යක්ෂයා දුරු කරන්නට අපට බැරිවූයේ මන්දැ"යි ඇසූහ. උන්වහන්සේ කතා කොට මෙසේ වදාළ සේක. "ඔබගේ ශ්‍රද්ධාව මදිකම නිසා ය. සැබැවින්ම මම ඔබට කියමි. අබ මල් රේණුවක් පමණක්වත් ශ්‍රද්ධාව ඔබට ඇත්නම් මේ කන්දට මෙතැනින් එතැනට යව යි කීවොත් එය යන්නේය. ඔබට නොකළ හැකි කිසිවක් නැත."

සුවිශේෂ වාක්‍යය එසේය.